නමෝ බුද්ධාය

දාහ නව වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක: 183

ශ්‍රී. බු. ව. 2559 | 2015 අගෝස්තු 29 | නිකිණි කළාපය

# බුද්ධි ප්‍රබෝධය ජීවිතයට බලපාන හැටි

කොළඹ විශ්ව විද්‍යාලයේ, සිංහල අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශනපති,

## අතිපූජ්‍ය අගලකඩ සිරිසුමන හිමිපාණන් වහන්සේ විසිනි

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

**"ද්වේ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා යො චායං කාමෙසු කාමසුකල්ලිකානුයොගො හීනො ධම්මො පොතුජ්ජනිකො අනරියො අනත්ථ සංහිතො එතෙ තෙ භික්ඛවෙ උභො අන්තො අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී, උපසමාය, අභිඤ්ඤාය, සමබෝධාය, නිබ්බාණාය සංවස්සති"**

- ධම්ම චක්ක පවත්තන සූත්‍රය

සැදැහැවත් පින්වතුනි,

මජ්ඣිම නිකායේ මහා වේදල්ල සූත්‍රයට අනුව ප්‍රඥාව ප්‍රධාන කොටස් තුනකට බෙදා දක්වයි. එනම් චින්තාමය ප්‍රඥා, සුතමය ප්‍රඥා හා භාවනාමය ප්‍රඥා යනුවෙනි. අන්‍යයන්ගෙන් කිසිවක් නො ඉගෙන තමාගේ චින්තනය අවදිකර ගැනීම හේතුවෙන් මිනිසා උරුම කර ගන්නා ප්‍රඥාව චින්තාමය ප්‍රඥා ලෙස **"පරතො අසුත්වා පටිලභති අයං වුච්චති චින්තාමය පඤ්ඤා"** යන බුද්ධ වචනයෙන් පැහැදිලි කෙරෙයි. එමෙන් ම අන්‍යයන්ගෙන් බොහෝ දේ ඇසීම හේතුවෙන් ලබා ගන්නා ප්‍රඥාව සුතමය ප්‍රඥාව ලෙස **"පරතො සුත්වා පටිලභති අයං වුච්චති සුතමය පඤ්ඤා"** යන බුදුවදනින් පෙනෙයි. අවසාන වශයෙන් දැක්වූ භාවනාමය ප්‍රඥාව අර්ථ දැක්වෙන්නේ **"සබ්බාරී සමාපන්තස්ස පඤ්ඤා භාවනාමය පඤ්ඤා"** යනුවෙන් සියල්ල තුළින් මිදී ලබන ප්‍රඥාව ලෙසය.

බෞද්ධයෙකු මෙම ප්‍රඥා තුන ළඟාකර ගැනීම සඳහා සමීප විය යුත්තේ බුදු හිමියන් වදාළ විශිෂ්ට දහම් මග වෙතට ටය. බොහෝ දෙනා බුදුදහමෙහි ගැඹුරු ඉගැන්වීම් කෙරෙහි අවධානය යොමු නො කිරීම නිසා මේ දහමෙහි දාර්ශනිකත්වය පිළිබඳ නිසි අවබෝධයක් නො ලබයි. විශේෂයෙන් බුදුරදුන් ප්‍රථම

ධර්ම දේශනාව ලෙස ඉදිරිපත් කළ දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙහි එන ප්‍රධාන කරුණු පිළිබඳ අවධානය යොමු කරන්නෙකුට බුදුරදුන් ලොවට ඉදිරිපත් කළ ප්‍රඥාගෝචර දර්ශනය වැටහෙනු ඇත. මෙහිදී මාතෘකාව වශයෙන් ලබා ගෙන ඇත්තේ දම්සක් පැවතුම් සූත්‍රය ආරම්භයේ ම එන වැදගත් පාඨයකි.

**"ද්වේ මේ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා"**

මහණෙනි, නිවන් ලබනු කැමති පැවිද්දා විසින් අන්ත දෙකක් නොසෙවිය යුතුය.

**"කාමසුඛල්ලිකානුයොගො හීනො ධම්මො පොතුජ්ජනිකො අනරියො අනත්ථ සංහිතො"**

හීන වූ ග්‍රාම්‍ය වූ, පහත් මිනිසුන් විසින් භාවිත කරන්නා වූ අනාර්ය වූ අනර්ථ වූ කාමසුඛල්ලිකානුයෝගය ඉන් එකකි.

කාමසුඛල්ලිකානුයෝගය යනු පස්කම් සුවයෙහි අන්තයට ගමන් කිරීමයි. මිනිස් ජීවිතයක් ලැබීමේ පරමාර්ථය ලෙස පස්කම් සැප අනුභවය බොහෝ දෙනෙකු විසින් කරන කල්පනාවකි.

මනුෂ්‍යයාට පසිඳුරන් ලැබී ඇත්තේ ඒවා හැකි තරම් තෘප්තිමත් කරලීම සඳහා නොවෙයි. ඉඳුරන්ගෙන් ලබා ගන්නා අරමුණු යහපත් බවට පත් කර ගැනීම ප්‍රඥාවන්තයාගේ ලක්ෂණය වන්නේය. එහෙත් මන්ද බුද්ධික හා උමතු වූ මිනිසුන් පංචකාම සම්පත් විෂයෙහි ඇලී, ගැලී, වෙලී එයින් ම විනාශය උරුම කර ගන්නා අයුරු පෙනේ. පුරුෂයාගේ සිත ඇලෙන්නා වූ රූපයත්, ශබ්දයත්, ගන්ධයත්, රසයත්, ස්පර්ශයත් වේ නම් ඒ කාන්තාවගේ රූපය, ශබ්දය, ගන්ධය, රසය හා ස්පර්ශය බව බුදු හිමියෝ පෙන්වා දුන්හ. එසේම කාන්තාවගේ සිත බැඳගන්නා වූ යම් රූපයක්, ශබ්දයක්, ගන්ධයක්, රසයක්, ස්පර්ශයක් වේ නම් ඒ පිරිමියාගේ ම බව බුදුහිමියෝ වදාළහ. සර්වඥතාඥානයෙන් මේ බව මනාව බුදුහිමියෝ අවබෝධ කළහ. බුදුවීමට පෙර රම්‍ය, සුරම්‍ය, ශුභ මාලිගාවන්හි සියලු පස්කම් සැප මධ්‍යයේ විසූ බෝසතාණන් වහන්සේ එහි ඇලී ගැලී සිටින තාක් කල් මුලාවකට හසුව ඇති අයුරු අවබෝධ කර ගන්නේ සතර පෙර නිමිති දැකීමෙනි. මිනිසුන්ගේ ලෝකය, රජ මැදුරේ ලෝකයට වඩා වෙනස් වන අයුරු අවබෝධ කර ගත් හෙයින් ඒ කාමභෝගී දිවියෙන් මිදෙන්නට අභිනිෂ්ක්‍රමණය කළහ.

කෝලිත උපතිස්ස දෙදෙනාගේ කථාව ද කාමභෝගි දිවි පෙවෙතේ ඇති නිස්සාරත්වය තහවුරු කරලයි. විනෝදකාමී ලෙස නෘත්‍යශාලාවලම කල් ගෙවූ ඔවුන් දෙදෙනා අවසානයේ ඒ කිසිවකින් සාර වූ තෘප්තියක් නොලැබූ හෙයින් සාරය

සොයා බුදුහිමියන් වෙතට පැමිණියහ. බුදු සසුනේ අග සව්වන් ලෙස පමණක් නොව, සැරියුත් හිමියන් මහා ප්‍රඥාවන්ත භික්ෂූන් අතරෙහි අගතැන්පත් වන්නටද කාමභෝගී දිවියෙන් බැහැර වීම හේතු විය. පස්කම් සැපතෙහි ඇලී ගැලී එය මිනිස් ජිවිතයක් ලැබීමේ එකම පරමාර්ථය ලෙස සලකා කම් සැපතෙහි වහලුන් බවට පත්ව සිටින මිනිසුනට, කෝලිත උපතිස්ස දෙදෙනාගේ කථා පුවත ප්‍රබල ආදර්ශයක් සම්පාදනය නොකරන්නේද? නිමා නැති කම් සැපත අඥබාල පෘථග්ජන මිනිසුනට ඉතා පහත් අනර්ථයක් ගෙන දෙන්නක් බව නොවැටහේ. එහෙත් කෝලිත උපතිස්ස දෙදෙනා සදාකාලික සැනසුම වෙතට යොමු කළේ බුද්ධි ගෝචර ජීවිතයයි. එබැවින් බුද්ධියෙන් විමසා බැලීම වැදගත් වෙයි.

දම්සක් පැවතුම් සූත්‍රයෙන් ගෙනහැර පාන මාතෘකාවේ දෙවන කොටසින් ඒ බුද්ධිගෝචර ජිවිතය ගොඩ නගා ගන්නා ආකාරය පෙන්වා දෙයි. එනම්, බුද්ධිමතා, විසින් තෝරා ගත යුතු වන්නේ මධ්‍යම ප්‍රතිපදාව යි. ඒ බව"**කතමා ච භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී, ඤාණකරණී, උපසමාය, අභිඤ්ඤාය, සම්බෝධාය නිබ්බාණාය සංවත්තන්ති**" යන්නෙන් දේශනාවෙහි දැක්වෙයි.

එහි අදහස වන්නේ මහණෙනි, තථාගතයන් විසින් අවබෝධ කරගත් ප්‍රඥාචක්ෂුස ඇති කරන මාර්ග ඥානය ඇති කරන, ක්ලේෂයන් දුරු කරවන විශිෂ්ට ඥානය පිණිස පවතින, චතුරාර්‍ය සත්‍යය අවබෝධය පිණිස පවතින, නිර්වාණය සාක්ෂාත් කර ගැනීම පිණිස පවත්නා ධර්මය "මධ්‍යම ප්‍රතිපදාවයි." යි ඒ අනුව තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කර වදාළ මෙම මධ්‍යම ප්‍රතිපදා ධර්මය ප්‍රඥා ඇස ලබා දෙන්නක් බව, මාර්ග ඥානය ඇති කරවන්නක් බව පැහැදිලිය. එසේම මිනිසාගේ කෙලෙස් සංසිඳුවන්නක් බව ද විශිෂ්ට ඥානය ඇති කරලීම පිණිස පවතින්නක් බවද පැහැදිලිය.

මේ මධ්‍යම ප්‍රතිපදාව වන්නේ කුමක්ද? ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. එනම්, සම්මා දිට්ඨි, සම්මා සංකප්ප , සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජිව, සම්මා වායම, සම්මා සති සහ සම්මා සමාධිය යි, පුද්ගල මනසත් රාගාදි කෙලෙසුන්ගෙන් බැහැර කොට පාපයෙහි මුදවාලන හෙයින් ද, රහත් බව නමැති ආර්ය භාවයට මග පෙන්වන බැවින් ද, මෙම ධර්මතා අටආර්ය මාර්ගය ලෙස පිළිගැනේ.

මෙම ආර්ය මාර්ගයේ සම්මා දිට්ඨිය සැකෙවින්, විමසා බැලිම මෙහිදි වැදගත් වනු ඇත. බුද්ධිමතෙකු අකුසල හා අකුසල් මූලයන්, කුසල සහ කුසල මූලයන් තත් වූ පරිද්දෙන් දකියි ද, දනිද ඔහු නිවැරදි දෘෂ්ටියක පිහිටන්නෙකි. එවිට ඔහු සමාජ දෘෂ්ටියක් ඇත්තෙකි. අචල ශ්‍රද්ධාවක ඔහු පිහිටයි. දුක හඳුනන ඔහු දුකෙහි හේතුවත්, එය නැති කරන මාර්ගයත් දකී. ඒ අනුව සම්‍යක් දෘෂ්ටිය යනු නිවැරදි යහපත් නුවණක් ගොඩ නගා ගැනීමයි. එමෙන්ම මෙම නිවැරදි

දෘෂ්ටිය ප්‍රධාන කොටස් තුනකට ද බෙදේ.

1. කම්මස්සකතා සම්මා දිට්ඨිය
2. විපස්සනා සම්මා දිට්ඨිය
3. මග්ග සම්මා දිට්ඨිය යනුවෙනි

ඒ අනුව කර්ම ඵල විශ්වාස කිරීමේ නුවණ ගොඩ නගා ගැනීම කම්මස්සකතා සම්මා දිට්ඨිය යි. විපස්සනා සම්මා දිට්ඨිය යනු පංචස්කන්ධය පිළිබඳ තතු නිවැරදිව අවබෝධ කර ගැනීමේ නුවණයි. චතුරාර්‍ය සත්‍යය දැකීමේ නුවණ මග්ග සම්මා දිට්ඨිය යි.

මේ අනුව ඕනෑම දෙයක යථා ස්වරූපය නිවැරදිව හඳුනා ගැනීමේ නුවණ, සම්මා දිට්ඨිය බව පෙනේ. මෙම සම්මා දිට්ඨිය ගොඩ නගා ගන්නා පුද්ගලයා ප්‍රඥාවන්තයකු ලෙස පිළිගැනේ. ලොව බොහෝ දෙනා දෘෂ්ටි ජාලයන්හි වෙලී පවති. එබැවින් නිවැරදි දෘෂ්ටියක පිහිටා ගත නොහැකිව බොහෝ මිත්‍යා පසුපස ගමන් කරන අයුරක් ලොව පුරා අද අපට පෙනෙයි. අමූලිකා ශ්‍රද්ධා යනුවෙන් ඉගැන්වෙන යමක යථා ස්වරූපය නොදැන ඒ පසු පස ගොස් මුලාවට පත්වෙයි. එහෙත් ආකාරවතී වශයෙන් ශ්‍රද්ධාව ගොඩ නගා ගන්නේ සම්මා දිට්ඨිය ඇති පුද්ගලයා ය. ඔහු නිවැරදි දේ නිවැරදිව දකී. ජීවිතය කිසිදා මුලාවක් බවට පත් කර නොගනී. ඒ අනුව සම්මා දිට්ඨියෙන් ඇති කර ගන්නා වූ බුද්ධිය මුලාවෙන් තොර, ප්‍රබෝධමත් ජීවිතයකට මග පෙන්වන බව පැහැදිලිය.

ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !